සංචාරකයන් මෙරටට පැමිණි බවට සාධක හමුවේ. මෙම ජාත්‍යන්තර ආගමික සංචාරණය ආගමික සංකල්ප මෙන්ම වෙනත් සංස්කෘතික ලක්ෂණ හුවමාරුවීම කෙරෙහි බලපෑවේ ය. සංචාරක කටයුතු ජනප්‍රිය වීමත් සමග ඒ සඳහා පහසුකම් සැපයීමට දොරටු පැන්මඩිය හා අම්බලම් වැනි ගොඩනැගිලි නිර්මාණය වීම දක්නට ලැබේ. මහනුවර යුගයේ දී වන්දනා කාව්‍ය හා වන්දනා ගාථාවලින් සමන්විත වන්දනා සාහිත්‍යයක් බිහි විය. සමස්තයක් වශයෙන් සලකා බැලීමේ දී අතීත ශ්‍රී ලංකාව තුළ සංස්කෘතික සංචාරණය හා බැඳුණු උප සංස්කෘතියක් නිර්මාණය වී පැවති බව පෙන්වා දීමට පිළිවන.

# 13

# බුදු දහම හා මැදිහත්කම

*මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි*

ජීවිතය ගැන, ලෝකය ගැන, සමාජය ගැන, පෞද්ගලික හා සාමාජික ගැටලු ගැන උපේක්ෂා සහගත ව, ඉවසිලිමත් ව, මැදිහත් ව සිතීමට අපොහොසත් වීම, සැකෙවින් කියතොත් සමබරව නොසිතීම නොදියුණු නොවැඩූ සිත් සතන් ඇත්තවුන්ගේ ස්වභාවයයි. ඒ හේතුවෙන් එක් අතෙකින් පෞද්ගලික ජීවිතය ඇසුරු කොටගත් බොහෝ අසහන පීඩනාදියට අපි ගොදුරු වෙමු. අනෙක් අතින් බොහෝ සමාජගත ගැටලු, ගැටුම් හටගැන්මෙන් සිත් සතන්හි සාමය, සැනසිල්ල අහිමි වෙයි. වැඩුණු නුවණ ඇති, වැඩුණු සිත්සතන් ඇති තැනැත්තා කවර තරමේ පෞද්ගලික ගැටලුවක දී වුව ද සමාජමය ගැටලුවක දී වුව ද උපේක්ෂා සහගතය. මැදිහත්ය. අන්තගාමී ව පක්ෂග්‍රාහී ව නො සිතයි. එබැවින් හෙතෙම ඉවසිලිමත්ය. අකම්පාය. හෙතෙම සිය සිතුම්පැතුම් මැනවින් පාලනය කරගනියි. අසහනයට දුකට පීඩනයට හසු නොවෙයි. විවෘත වූ සැහැල්ලු සිතින් ජීවිතයට මුහුණ දෙයි. ප්‍රියශීලී අයෙකු වෙයි. සැබැවින්ම හෙතෙම ප්‍රීතිමත්ය. සතුටින් වසන්නේය. මෙබඳු දියුණු සමබර මානසික තත්ත්වයක් ඇති ප්‍රසන්න ප්‍රමුදිත පුද්ගලයකු වීමට මග පෙන්වන විශිෂ්ට ධර්ම මාර්ගයක් ලෙස බුදුදහම හැඳින්විය හැකිය.

ලෝ වැස්සන් නිබඳ ව ම විවිධාකාර වූ අන්තවාදී අදහස්වල එල්බ සිටින සැටි බුදුදහම පෙන්වාදෙයි. එම අන්තවාදීවීම් විටෙක ආගමිකය. තවත් විටෙක දර්ශනිකය. බැතිමත්හු ආගමික ව අන්තවාදී වෙති. ඔවුහු තම තමන් පිළිගන්නා තම තමන් අදහන, විශ්වාස කරන ආගමික මතයෙහිමැ එල්බගෙන සිටිති. ඉන් බැහැර ව නො සිතති. බොහෝ විට සාමාන්‍ය, පොදු මහජනයා අතර මෙවැන්නෝ සුලබ වෙති. තර්ක විතර්ක, වාද විවාදදියෙහි දක්ෂ බුද්ධිමත්තු දර්ශනික අන්තවාදියෝ වෙති. ඔවුහු අනේකවිධ හේතුසාධක මත සහේතුක ව සකාරණ ව තමන් පිළිගන්නා දර්ශනික මතවාදයෙහි ම එල්බගෙන සිටිති. ඉන් බැහැර ව නො සිතති. බොහෝ විට විවිධ ධර්ම ශාස්ත්‍රාදියෙහි නිපුණ වූ උගතුන් අතර මෙවැන්නෝ නොඅඩු ව සිටිත්. මේ හැරුණු විට සමාජ, සාංස්කෘතික කරුණු පිළිබඳ ව විවිධාකාර වූ හේතුසාධක දක්වමින් අන්තවාදී ව සිතන්නෝ පොදු ජන සමාජය තුළ නොමද ව ම සිටිති. පෞද්ගලික වූ ගෘහාශ්‍රිත ජීවිතය හා බැඳුණු කාරණාවල දී මෙන්ම එම ජීවිතය ආශ්‍රිත ප්‍රශ්නවල දී ද අන්තගාමී ව සිතා ක්‍රියා කරන්නෝ ද මෙම

ගණයට අයත් වෙති. එසේ ම සිය වෘත්තීය ජීවිතය, බාහිර සමාජ ජීවිතය ආශ්‍රිත කරුණු, ගැටලු ආදියෙහි දී ද එක් අන්තයක ම රැඳෙමින්; එක් පක්ෂයකට ම වහල් ව, එක් අදහසක ම එල්බ ගැනීම ද සමාජයෙහි දැකගත හැකිය. ආගමික, දර්ශනික, ශාස්ත්‍රීය, සාමාජික හෝ පෞද්ගලික කරුණුවල දී මෙසේ එක් මතයක ම එල්බ සිටීම බුදුදහම හඳුන්වන්නේ දෘෂ්ටි ග්‍රහණය කිරීමක් ලෙසය. අන්තග්‍රාහී වීමක් ලෙසය. උපාදාන ග්‍රහණයක් ලෙසය. බුද්ධ කාලීන භාරතීය ආගමික දර්ශනික සංස්කෘතික පරිසරය තුළ එසේ දෘෂ්ටි ග්‍රහණය කළ, අන්තග්‍රාහී වූවෝ නොමඳ ව ම සිටියහ. ඔවුන්ගේ එම අන්තවාදී අදහස්, මතවාද, පාලි සූත්‍ර දේශනාවල නිබඳ ව ම වාර්තා කොට තිබේ. විටෙක සූත්‍ර දේශනාවෝ එබඳු අන්තග්‍රාහී මතවාද දෙසැටක් ගැන සඳහන් කරති.[1] තවත් විටෙක එවන් අන්තවාද බොහෝ ගණනක් ඇතැයි පෙන්වා දෙති.[2] සමකාලීන අන්තවාදී අදහස් දෙයාකාර යයි ද සිව් ආකාර යයි ද දක්වා ඇති අවස්ථාවන් සුලබය.[3] ඒ බඳු අන්තවාදියෝ "තම මතය ම, තම අදහස ම සත්‍යය. සෙසු මත, සෙසු අදහස් අසත්‍යය, වැරදියැ" යි සිතති. කියති. කරුණු දක්වති.[4] අප ජීවත්වන මේ සමාජයේ ද මෙවැන්නවුන් දැකගත හැකිය.

ජීවිතය ගැන හෝ ලෝකය ගැන හෝ සමාජය ගැන හෝ එසේ එක් අන්තයකට වැටී සිතීම, කථා කිරීම බොහෝ ගැටලුවලට මුල් වන්නකි. අන්තවාදියා තම මතයෙහි ම සිරවී සිටියි. තම පක්ෂයට ම ගැතිවෙයි. ඔහු තමා පිළිගත් මතයෙහි, පක්ෂයෙහි සිරකරුවෙකු වැනිය. වහලෙකු වැනිය. එය ම සත්‍යය නිවැරදි යැයි සිතන හෙතෙම එහි ම එල්බගෙන සිටියි. ඔහුට නිදහසේ සිතා විමසා බැලිය නොහැකිය. මතය, අදහස, පිළිගැනීම විසින් නටවන රූකඩයක තත්ත්වයට පත්වන හෙතෙම ඇති තතු ඇති හැටියෙන් නො දකියි. හෙතෙම අනුන්ට සවන් නො දෙයි. අනුන් පවසන අදහස සත්‍යය ද, අසත්‍ය දැයි නො විමසයි. නො සිතයි. තම මතයෙහි ම ගිලෙයි. ඔහු අන්ධයෙකු වැනිය. එසේ ම අන්තවාදියා තුළ ඉවසීම ද නැත. තම මතයට එකඟ නොවන්නවුන් ගැන, ප්‍රතිපක්ෂ මත දරන්නවුන් ගැන හෙතෙම කෝපයට ද පත්වෙයි. ඔවුන්ට පහර දෙයි. ඔවුන් සමග ගැටෙයි. වාද විවාද කරයි. තම මතය ම නිවැරදි බවත් සෙසු මත වැරදි බවත් කියමින් තර්ක කරයි. හේතුසාධක ද දක්වයි. කරුණු ඉදිරිපත් කරයි.[5] එසේ වාචික ව කරුණු දැක්වීම් වාද විවාද තර්ක විතර්ක විටෙක කෙළවර වන්නේ කායික ව ද අන් මතවාදීන්ට පහර දීමෙනි.[6] අන්තවාදීහු එක් පැත්තකින් පමණක් ගැටලු දකින්නෝය. බුදුදහම ඔවුන් හඳුන්වන්නේ "ඒකංගදස්සී" යනුවෙනි.[7] ඔහුගේ චින්තනය පටුය. ගැටලුව පුළුල් ලෙස හැම පැත්තකින් ම දැක්මට ඔහු අසමත්ය. මෙසේ ක්‍රියා කරන, මෙම තත්ත්වයට පත් පුද්ගලයෝ පවුල් පරිසරය තුළ ද වෘත්තීය පරිසරය තුළ ද ආගමික දර්ශනික ධර්ම ශාස්ත්‍රීය පරිසරය තුළ ද දක්නා ලැබෙත්.



බුදු දහම අනුව කවර ආකාරයක හෝ අන්තවාදී අදහසක එල්බ ගැනීම ඇත්ත ඇති හැටියෙන් දැක්මට බාධාවකි. කවර කරුණක දී වුව ද සියලු අන්තග්‍රාහී කල්පනාවන් පසෙකින් තැබිය යුතු යැයි බුදුරදුන් වදාළේ එබැවිනි.[8] බුදු සමයෙහි එබඳු චින්තාවන් ඨපනීය (පසෙකින් තබන) ගණයට ඇතුළත් වෙයි. ඒවා බුදුරදුන් විසින් විසඳනු නොලැබේ. (අව්‍යාකෘත) බුදුරජාණන් වහන්සේ සමකාලීන දෙසැටක් වූ අන්ත්‍රාහී මතවාදයන් පසෙකින් තැබූහ. ඉන් එකක හෝ එල්බ නො ගත්හ. හැටතුන් වැනි අන්තවාදයක් ද ඉදිරිපත් නො කළහ. එම මතවාද සියල්ල පසෙකින් තබා උත්තරීතර වූ යථාර්ථය සත්‍යය දැන දකගත්හ.[9] ඒ මධ්‍යස්ථ චින්තනයෙනි. සමබර වූ හේතුඵල දර්ශනයෙනි. මූලික වශයෙන් මැ එකී සමකාලීන අන්තවාදීහු දෙයාකාර වූහ. ඒ නිත්‍යාත්මයක් ඇත යන ශාස්වත දෘෂ්ටිය හා නිත්‍යාත්මයක් නැත යන අශාස්වත දෘෂ්ටිය යනුවෙනි. බුදු සමය එම උභයාන්තය ම පසෙකින් තබා සමබර මධ්‍යස්ථ චින්තනය ඉගැන්වෙන හේතුඵල දර්ශනය ම ප්‍රකාශ කරයි.[10] එකී උභයාන්තය ම පාදක කොටගත් අන්තවාද සතර (චතුෂ් කෝටික දෘෂ්ටිය) ද පසෙකින් තබන හේතුඵල දැක්ම වූකලි බුදුන් වදාළ මධ්‍යම දේශනාවයි.[11] මෙසේ සියලු කරුණුවල දී මැදිහත් ව හේතුඵල දහම අනුව සිතිය යුතු ය. අන්තග්‍රාහී නොවිය යුතුය.[12] සමකාලීන සාමයික ප්‍රතිපදාවෝ ද අන්තවාද දෙකකට ඇතුළත් වූහ. එනම් නිත්‍යාත්මයක් ඇතැයි ශාස්වතවාදී වෙමින් අත්තකිලමථානුයෝගී ව තමා තමාට ම කටුක වූ අධික දුක් පීඩා කළ පිළිවෙත හා නිත්‍යාත්මයක් නැතැයි අශාස්වතවාදී ව උපරිම වශයෙන් පස්කම් සුවයෙහි ඇලීමේ පිළිවෙතයි. මෙම උභය ප්‍රතිපදාවන් ද බුදු දහම දකින්නේ අන්තවාදී පිළිවෙත් ලෙසය. පළමුවැන්න ආත්මවාදී ආගමික උමතුවක් වැනිය. දෙවැන්න ආත්මවාද විරෝධී, ආගම් විරෝධී පිළිවෙතකි. මෙකී අත්තකිලමථානුයෝගය මෙන් ම කාම සුඛල්ලිකානුයෝගය ද බැහැර කළ බුදුරජාණන් වහන්සේ එම උභයාන්තයට ද නොවැටී මධ්‍යස්ථ වූහ. මැදුම් පිළිවෙත ඉගැන්වූහ.[13] මෙසේ චින්තනයෙන් මෙන් ම චරණයෙන් ද අන්තග්‍රාහී නොවන්නට ද මැදිහත් ව සිතන්නට හා පිළිපදින්නට ද බුදු සමය ශ්‍රාවක ප්‍රජාවට මගපෙන්වයි. සමබර දැක්මක් මත පිහිටා සමබර පිළිවෙතක් අනුගමනය කිරීම එහිලා අපේක්ෂා කෙරේ.

අන්තග්‍රාහී, අන්තවාදී නොවන මැදිහත් තැනැත්තාට නිදහස් ව විචාරපූර්වක ව සිතිය හැකිය. හෙතෙම අනුන්ට සවන් දෙයි. අනුන්ගේ අදහස්වලට ද ගරු කරයි. විරුද්ධ අදහසක් ඔහුට නැත. අන්තවාදී ව කිසිවක් පිළිනොගන්නා ඔහු අන්තවාදී ව කිසිවක් ප්‍රතික්ෂේප ද නො කරයි.[14] හෙතෙම අනුන්ගේ මතවාද අසා නො කිපෙයි. ඔහු ඉවසිලිමත්ය. නුවණැත්තේය. කවර කරුණක වුව ද කවර ගැටලුවෙක වුව ද එක් පැත්තකින් පමණක් බලා (එකංගදස්සිව) තීරණ නො ගනී. වඩාත් පුළුල් ව හැම පැත්තකින් ම ගැටලු දෙස බලයි. ඇත්ත ඇති හැටියෙන් දකියි.

ඔහු කඳු මුදුනකට නැගුණෙකු වැනිය. එවැන්නෙකුට හැම පැත්තක් ම පෙනේ. එබැවින් එක් පැත්තක එල්බ ගන්නේ නැත.[15] මේ බෞද්ධ චින්තන ක්‍රමයයි. මෙසේ මැදිහත් ව, ඉවසිලිමත් ව, විචාරපූර්වක ව, නිදහසේ සිතන, නිදහසේ සදාචාර මාර්ගයේ ගමන් කරන පුළුල් දැක්මක් ඇත්තෙකු වීමට බුදුරජාණන් වහන්සේ නොයෙක් විට නොයෙක් අයුරින් ශ්‍රාවකයන් දැනුවත් කළහ. මෙහි දී බුද්ධ වචනය වුව ද අන්තවාදී ව කරගසා ගැන්ම, එල්බගැන්ම නොකළ යුතු යැයි උගන්වා තිබේ. දහම පහුරක් වැනිය. එය ඇත්තේ කරගසාගෙන දැඩිව එල්බ ගැනීමට නො වේ. ගැටලු විසඳා ගැන්මටය. දුකින් මිදෙන්නට යයි පෙන්වා දෙන ලදී. ශ්‍රාවක ප්‍රජාව සිය දහමෙහි වුව ද වහලුන් සේ "මෙය ම සත්‍යය. අන් සියල්ල අසත්‍ය යැයි" අන්තවාදී වීම උන්වහන්සේ අපේක්ෂා නො කළහ. එය දහම වරදවා ගැන්මකි. එලෙස බුදුදහම අන්තවාදී ව ගැනීම සර්පයෙකුගේ වලිගයෙන් අල්ලා ගැන්මක් වැනි යැයි පෙන්වා දෙන ලදී. වලිගයෙන් ඇල්ලූ විට සර්පයා ඇල්ලූ තැනැත්තාට දෂ්ට කරයි. සර්පයෙකු අල්ලාගත යුත්තේ උගේ හිසෙනි. එමෙන් ම බුදු වදන ද නිවැරදි ව ගත යුතුය.[16] බුදු වදනෙහි අරමුණ ද එහි අර්ථය ද ස්වභාවය ද නිසි පරිදි දැක ඒ වෙත එළඹීමට බුදුරදුන් විසින් උගන්වන ලද්දේය.

බුදු දහමෙහි පදනම වන්නේ හේතුඵල දර්ශනයයි. එනම් පටිච්ච සමුප්පාදයයි. පටිච්ච සමුප්පාදය දැකීම නම් බුදු දහම දැකීම ය. බුදු දහම දැකීම නම් පටිචච සමුප්පාදය දැකීමය.[17] සිව්සස්දැක්ම මෙන් ම තිලකුණු දැක්ම ද ඇතුළු සියලු බෞද්ධ සිද්ධාන්තයෝ ඒ හා බැඳෙති. මෙකී මූලික බෞද්ධ ඉගැන්වීම් මැදිහත් චින්තනය ද ඒ අනුව ගිය මැදිහත් පිළිවෙත ද අර්ථවත් කරයි. මිනිස් ජීවිතයේ යථාර්ථය වූ සංසාරගත දුකත්, ඉන් අත්මිදීමේ මගත් මැදුම් පිළිවෙත මත පිහිටාගෙන පැහැදිලි කිරීම බුදු දහමෙහි ස්වභාවයයි. මධ්‍යස්ථබව මත පිහිටි ඉහත කී මූලික බෞද්ධ ඉගැන්වීම් අනුව ගිය චින්තනය මෙන් ම චරණය ද ඇති තැනැත්තා වූකලී තැන්පත්ය. සංවරශීලීය. ජයග්‍රහණයෙන් වෛරය ද පරාජයෙන් දුක ද උපදනා බව දන්නා හෙතෙම තරගයට එක් නො වෙයි. එබැවින් ම ජය ද පරාජය ද නො ලබයි. සුවසේ වසයි.[18] අතීතයට එක්වූ දේ ගැන හෙතෙම ශෝක නො වෙයි. අනාගතයට අයත් නූපන් දේ ගැන ද හෙතෙම අපේක්ෂා හරිත ව නො තැවෙයි. වර්තමානයෙන් යැපෙන තුටුපහටුවන හෙතෙම ප්‍රසන්නය.[19] මේ වූකලි මැදිහත් සිතුවිලි ද මැදිහත් පැවතුම් ද ඇති ව ඇති තතු ඇති හැටියෙන් දන්නා දක්නා තැනැත්තාගේ ස්වභාවයයි. කුඩා දියපහර අවම අත්දැකීම් ඇත්තේය. අවම හැකියාවන් ඇත්තේය. එහෙත් මහ හඬ ඇත්තේය. මහා ගංගාව වූකලී උපරිම අත්දැකීම් සහිතය. උපරිම හැකියාවන් සහිතය. එහෙත් නිහඬය. මැදිහත් ව දිවි මග හැඩගසාගත් එසේ නැත්නම් බුදුදහම අනුව ජීවිතය ගොඩනඟාගත් තැනැත්තා ද මහ ගංගාවක් වැනිය.[20] ධර්මාවබෝධය අත්දැකීමක් කොටගත් එම ශ්‍රාවකයා වූකලී අකම්පා‍ය වූ



සිත් සතන් ඇත්තෙකි.[21] හෙතෙම අටලෝ දහමින් කම්පා නො වෙයි. පෘථිවියෙහි ගැඹුරට ම සිටුවන ලද මහ ටැඹක්, ඉන්ද්‍රකීලයක් සිව් දිගින් හමන වාත වේගයෙන් කම්පා නොවන්නා සේ හෙතෙම අකම්ප්‍යය. කායික වූත් මානසික වූත් උක්ත සංවරය ඇති බැවින් ම හෙතෙම සදාචාර සම්පන්නය. එහෙත් මානසික පාරිශුද්ධියට තුඩු නොදෙන දැඩි ව එල්බගත් සදාචාර පිළිවෙතක් ඔහු තුළ නැත.[22] ඇත්තේ මධ්‍යම ප්‍රතිපදාවයි. සිත් සතන්හි වැඩීමට උපකාරි වන පිළිවෙතයි. චරිත සංවර්ධනයට තුඩු දෙන සදාචාරයයි.

මැදිහත් ව සිතන, මැදිහත් ව පිළිවෙත් පුරන තැනැත්තා සාමකාමීය. ඔහු කිසිදු අදහසකට මතයකට විරුද්ධ ද නැත. අන්තගාමී නොවන හෙතෙම දැඩි ව යමකට එරෙහි නො වෙයි. එසේ ම ඔහු කිසිදු මතයකට අදහසකට වහල් නො වන්නෙකි. එබැවින් යම් මතයකට තදින් පක්ෂපාතී ද නො වේ. සැබෑ මැදිහත්කම නම් විරුද්ධ නොවීම මෙන් ම පක්ෂ ද නො වීමයි. පූර්ව නිගමනයකට නොපැමිණ මධ්‍යස්ථ ව විචාර පූර්වක ව පක්ෂ විපක්ෂ අදහස් විමසීමට ඔහුට අවස්ථාව ලැබේ. එබැවින් ඔහුට සාමයෙන් කටයුතු කළ හැකිය. ඇත්ත නැත්ත ඉවසිලිමත් ව විමසා තේරුම් ගත හැකිය. ගැටුමක් ඇති කර නොගන්නා ඔහු මැදිහත් ව නිදහස් ව සිතයි. එබැවින් හැම පැත්තක් ම තේරුම්ගෙන නිවැරදි අදහසට එළඹීමට ඔහුට හැකියාව ද ලැබේ.

## පාදක සටහන්

1. සබ්බේ තෙ ඉමෙහෙව ද්වා සට්ඨියා වත්ථූහි අධිවුත්තපදානි අභිවදන්ති.
   (දී.නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, පිට. 782)
2. සච්චානි සූතානි බහූනි නා නා
   - සූ.නි. ට්ඨක වග්ග, චූග වියුහ සූත්‍රය, පිට 280.
3. ද්වය නිස්තෝයං බො කච්චාන ලොකො.
   ස.නි. 4 කචචානගොත්ත සූත්‍රය, පිට 28.
4. ඉධමෙව සච්චං මොඝ මඤ්ඤන්ති. (බොහෝ සූත්‍රවල)
5. තත්කංච දිට්ඨීසු පකප්පයිත්වා - සච්චං මුසාති ද්වයධම්ම මාහු.
   අට්ඨක වග්ග - චූල විසුහ සූත්‍රය, පිට 280.
6. භණ්ඩන ජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛ සත්තීහි විතුදන්තා විහරන් උදාන පාළි - දුතිය නානා තිත්ථිය සූත්‍රය - පිට 266.
7. ඉමෙසු කිර සජ්ජන්ති එකෙ සමණ බ්‍රාහ්මණා
   විග්ගය්හනං විවදන්ති ජනා ඒකංග දස්සිනො
8. ම.නි. 2, චූල මානුක්‍ය සූත්‍රය, පිට 152.
9. අයං ඉමෙහි සබබෙහෙව උත්තරීතර පජානාති
   දි.නි. 1, බ්‍රහ්මජාල සූත්‍රය, පිට 78.
10. ස.නි. 4, කච්චාන ගොත්ත සූත්‍රය, පිට 30.

11. එතෙ තෙ උභො අන්තෙ අනුපගම්ම. මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති අවිජ්ජා පච්චයා සංඛාරා.....
    ස.නි. 4, අචේලකස්සප සූත්‍රය - පිට 30.
12. යෙ ධම්මා හෙතුප්පභවා..... මහාවග්ග පාළි 1, පිට 84.
13. එතෙ තෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභි සම්බුද්ධා ස.නි. 5, ධම්මචක්කප්පවත්තා සූත්‍රය - පිට 270.
14. නෙව අභිනන්දි තබ්බං න පටික්කොසිතබ්බං.
    දී.නි. 2, මහා පරිනිබ්බාන සූත්‍රය, පි. 194.
15. පබ්බතට්ඨො ච භුම්මට්ඨො - ධම්මපද - අප්පමාද වග්ග 8.
16. කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි නිත්ථරණත්ථාය නො ගහණත්ථාය
    ම.නි. 1, අලගද්දූපම සූත්‍රය, පිට 336.
17. යො පටිච්ච සම්ප්පාදං පස්සති සො ධම්මං පස්සති.....
18. ජයං වෙරං පසවති - දුක්ඛං සෙති පරාජිතො
    උපසන්තො සුඛං සෙති හිත්වා ජය පරාජයං
    ස.නි. 1, පඨම සංගාම සූත්‍රය, පිට 154.
19. අතිතං නානු සොචන්ති - නප්පජ්ජපන්ති නාගතං
    පච්චුප්පන්නෙන යාපෙන්ති - තෙන වණ්ණො පසීදති
    සු.නි. 1, අරඤ්ඤ සූත්‍රය, පිට 10.
20. සණන්තා යන්ති කුස්සොබ්භා තුණ්හී යාති මහොදධී
    සු.නි. නාලක සූත්‍රය, පිට 222.
21. පුට්ඨස්සලොක ධම්මෙහි චිත්තං යස්ස නකම්පති
    සු.නි. මංගල සූත්‍රය, පිට 82.
22. යථින්දඛීලො පඨවිං සිතොසියා - සු.නි. රතන සූත්‍රය, පිට 70.

# 14

## සාංදෘෂ්ටික අධිසත්තාව හා ආචාරවාදී නවකතාව

*ආචාර්ය සාලිය කුලරත්න*

සත්තාව යන්න ප්‍රබන්ධයෙහි මතු නොව මානවශාස්ත්‍ර ක්ෂේත්‍රයේ විවිධ පරාසයන්හි විද්‍යා විෂය ධාරවේ ද නිරන්තර භාවිතයේ ඇති වදනකි. සත්තා යන්න **ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ** විවරණය වන්නේ "විද්‍යමාන, තිබෙන" ආදි අරුතිනි. සත්වයා යනු ද ඊට පර්යාය වෙයි.[1] අධිසත්තා යන සමාස වූ යෙදුම නූතනයේ සම්පාදනය වූ සිංහල ශබ්ද කෝෂ බොහෝමයක ඇතුළත් නො වේ. මහැදුරු සුනන්ද මහේන්ද්‍රගේ **සාහිත්‍යකලා ශබ්දකරයෙහි** "Surrealism"යන ඊට සමාන ඉංග්‍රීසි වචනය විවරණයේ දී අධිසත්තාව යන්නට කෙටි විවරණයක් සැපයී තිබේ. "අධිතාත්වික වාදය මගින් කියැවෙන්නේ සිහින ලෝකයක් හෙවත් මායාමය තලයකින් යථාර්ථය අර්ථකථනය කළ හැකි බවකි"යි[2] එහි වූ යාන්ත්‍රණය හඳුන්වා ඇත. මහැදුරු ඒ. වී සුරවීර සිය **සාහිත්‍ය විචාර ප්‍රදීපිකාවෙහි**, අධියථාර්ථවාදයෙහි ඉතිහාසය සැකෙවින් දක්වා ජේම්ස් ජොයිස්ගේ "Finnegans wake (1939) නවකතාව නිදසුනක් සේ උපුටා දක්වා තිබේ.[3]

ෆ්‍රොයිඩියානු සිහින විශ්ලේෂණ ක්‍රමයේ දී (Freudian theory of dream analysia ස්වප්නයක දක්නට ඇති ගුප්ත බව (Latent) හා අස්වාභාවික බව (distorted) එකී ස්වප්නයට ආවේණික ස්වප්න කෘත්‍යය යැයි (Dream work) දැක්වේ. එය ද්විතීයික වර්ධනයේ දී ඌනපූරක හා විද්‍යමාන යාන්ත්‍රණයක් සේ හඳුනාගත හැකි වේ.[4] අධිසත්තාව තුළ දී ද සිහිනයක දක්නට ඇති යාන්ත්‍රණය ක්‍රියාත්මක වේ. විඥාන ධාරා (The stream of consciousnes) ක්‍රමයේ දී, අවදි ව සිටිමින් ම, සිහින දොරටුවකින් ඇතුළුවීමක් හෙවත් දිවා සිහින (day dreams) තත්ත්වයක් අත්දැකීමට ලැබේ. සර් ආතර්වේලිගේ "chinese dream" කෘතියේ මෙවන් අවස්ථා ඇතුළත් වේ. එහි දැක්වෙන අන්දමට එක් රාජ්‍ය නිලධාරියෙකු වරක් උණ රෝගයෙන් ඔත්පල ව වැතිර සිටිය දී, ඔහුගේ ආත්මය ඔහුගේ පොකුණේ මාළුවකුට ආරූඪ වෙයි. නිලධාරියාගේ අරක්කැමියා ඒ මාළුවා ඇමක් යොදා අල්වාගෙන මැරීම පිණිස මන්නය ඔසවයි. නිලධාරියා "මරන්න එපා" යනුවෙන් සිය කුටියේ සිට මොර දෙයි.[5] අධිසත්තාව නිරන්තර ව වඩා ද්විතියික තත්ත්වයකි. අප කා තුළත් ප්‍රාථමික ලෝකය පිළිබඳ ජනශ්‍රැතියක් තහවුරු ව පවතී. ඈන් ස්වින්ෆෙන් (Ann swinfen) දක්වන අන්දමට ප්‍රාථමික ලෝකය පිළිබඳ ව (පාඨකයා කෙරෙහි) ඇති කෙරෙන වර්ධනීය